# උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III ශ්‍රේණියට
# සීමිත පදනම මත බඳවා ගැනීම - 2026

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන සේවා ව්‍යවස්ථාවේ 6:3:1 උප වගන්තිය අනුව සීමිත බඳවා ගැනීම් මඟින් රියදුරු සේවයේ III වන ශ්‍රේණියේ පුරප්පාඩුව පවතින රියදුරු තනතුරු 24 ක් සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ , PL -1 සහ PL -2 වැටුප් කේතය හිමි තනතුරක සේවය කරන , සේවකයින්ගෙන් 2026 .06.19 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** **බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-**

(i) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය

(ii) අයදුම්කරුවන්ගේ උස අවම වශයෙන් අඩි 5 යි අඟල් 2 ½ ක් විය යුතුය

(iii) දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර , මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. ඒ බව සනාථ කිරීම සඳහා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් නිකුත් කරන ලද විධිමත් වෛද්‍ය සහතිකය අයදුම්පත සමඟ අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු වේ.)

(iv) උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ , ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් (PL -1 ) හෝ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයට අයත් ( PL -2 ) තනතුරක ,

(අ) ඉල්ලුම්පත් කැඳවන දිනට අවම වශයෙන් වසර (3) කට නොඅඩු අඛණ්ඩ සක්‍රීය හා සතුටුදායක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
හා
(ආ) පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කර තිබීම හෝ අයදුම්පත් කැඳවන දිනට ස්ථිර කිරිමට අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා තිබීම

| අනු අංකය | තනතුර හා බඳවා ගන්නා ශ්‍රේණිය | අධ්‍යාපන සුදුසුකම් , වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | බඳවා ගැනීමේ ලිඛිත විභාගය හා වෘත්තීය පරීක්ෂණය |
|---|---|---|---|
| 01 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ රියදුරු III ශ්‍රේණිය<br><br>**වයස**<br><br>අදාළ නොවේ | **අධ්‍යාපන සුදුසුකම්**<br><br>රජයේ අනුමත පාසලකින් අවම වශයෙන් 8 ශ්‍රේණිය හෝ 9 වසර සමත්වී තිබීම<br><br>**වෘත්තීය සුදුසුකම්**<br><br>I. පෞද්ගලික / කුලී රථ සහ තාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.<br><br>(බඳවා ගන්නා දිනට වසර තුනකට පෙර අවම වශයෙන් සී සහ සී1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය.)<br><br>II. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය. | **ලිඛිත විභාගය**<br><br>සාමාන්‍ය දැනීම , මෝටර් රථ දැනුම , සාමාන්‍ය බුද්ධිය මැනීම ඇතුළත් පැය 1 ක කෙටි ප්‍රශ්න පත්‍රයකි<br>(සමත්වීම සඳහා ලකුණු 40% ක් ලබා ගත යුතුයි)<br><br>**වෘත්තීය පරීක්ෂණය**<br><br>මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම,<br>රිය පැදවීමේ නිපුණතාවය , මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම පරීක්ෂා කරන වෘත්තීය පරීක්ෂණයකි.<br><br>උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | | **පළපුරුද්ද**<br><br>වාහන රියදුරෙකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය.<br>(පළපුරුද්ද සහතික මඟින් සනාථ කල යුතුයි.) | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකවරයෙකුගේ සභාපතිත්වයෙන් මෙම පරීක්ෂණය පැවැත්වේ. මෝටර් රථ පරීක්ෂක , පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකු හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු ඇතුළු තිදෙනෙකුගෙන් යුත් මෙම පරීක්ෂණ මණ්ඩලය මඟින් වෘත්තීය පරීක්ෂණයෙන් සමත්වීම තහවුරු කළ යුතුයි.<br><br>**සම්මුඛ පරීක්ෂණය**<br><br>බඳවා ගැනීමේ මූලික සුදුසුකම් පරීක්ෂා කෙරේ. ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ |

**03.** වැටුප් පරිමාණය :

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ රියදුරු III ශ්‍රේණියේ සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි PL 3 -2025 අනුව රු.42,780 - 10 x 490 – 10 x 540 – 10 x 590 – 12 x 630 – 66,540/- ක වැටුප් පරිමාණය හිමිවේ.

**04.** බඳවා ගැනීමේ ක්‍රමය **:**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීමට අනුමත පුරප්පාඩු පිරවීම සඳහා , පළාත් රාජ්‍ය සේවයේ නියුතු සක්‍රීය හා සතුටුදායක සේවයක් සහිත සුදුසුකම් ඇති අය අතුරින් අභ්‍යන්තර නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් පරීක්ෂා කිරීමෙන් පසු සුදුසුකම් ඇති අයදුම්කරුවන් ලිඛිත විභාගයකට කැඳවන අතර ඊට පෙනී සිට සමත් විය යුතු අතර මාර්ග නීති හා රිය පැදවීමේ නිපුණතාවය පරීක්ෂා කිරීමේ වෘත්තීය පරීක්ෂණයකට ද පෙනී සිට සමත් විය යුතුය. (ලිඛිත විභාගයේ ලකුණු කුසලතාවය මත වෘත්තීය පරීක්ෂණයට කැඳවන සංඛ්‍යාව අවස්ථාවෝචිත පරිදි තීරණය කරනු ලැබේ). වෘත්තීය පරීක්ෂණයෙන් සමත්වන අය ලිඛිත විභාගයේ ලකුණු කුසලතාවය අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත්වීම් බලධාරියා වන පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්වීම් ලබා දෙනු ලැබේ.

**ලිඛිත විභාගය :**

**සාමාන්‍ය දැනීම , මෝටර් රථ දැනුම , සාමාන්‍ය බුද්ධිය මැනීම ඇතුළත් පැය 1 ක කෙටි ප්‍රශ්න පත්‍රයකි . (සමත්වීම සඳහා ලකුණු 40% ක් ලබා ගත යුතුයි.**

**වෘත්තීය පරීක්ෂණය :**

වෘත්තීය පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායකයින් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| II මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| III මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

වෘත්තීය පරීක්ෂණය සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 50% ක් ලබා ගත යුතුයි.

**05. අයදුම්පත් ඉදිරිපත් කිරීම :**
මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව අයදුම්පත් ඉදිරිපත් කල යුතුය. අයදුම්පත් නිවැරදිව හා පැහැදිලිව තම අත් අකුරින්ම සම්පූර්ණ කල යුතුය. අයදුම්පත්‍රයේ අංක 01 සිට 04 දක්වා ඡේදයන් පළමුවන පිටුවටද , ඉතිරිය ඊළඟ පිටු වලටද ඇතුළත් වන පරිදි " ඒ 4 " ප්‍රමාණයේ කඩදාසි වල අයදුම්පත්‍රය පිළියෙළ කළ යුතුය. අයදුම්පත තම ආයතන ප්‍රධානියා මඟින් 2026.06.19 දිනට පෙර ලැබෙන සේ " ලේකම් , පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව , උතුරු මැද පළාත " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ " උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම - 2026" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

**06. විභාග හා පරිපාලන වියදම් :**
විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු 720.00 කි. මෙම මුදල උතුරු මැද පළාත් සභාවේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන පරිදි උතුරු මැද පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලද ලදුපත (NC 100 )අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ මුල් පිටපත අයදුම්පත්‍රයට අමුණා එවීම අනිවාර්ය වන අතර , ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත්වේ. උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතන වලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර , කුමන හේතුවක් නිසා හෝ මෙම විභාග හා පරිපාලන ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

**07.** නිසි පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් හා මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**08.** මෙම තනතුර සඳහා බඳවා ගැනීම හෝ නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව සම්බන්ධ අවසාන තීරණය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

**09.**එමෙන්ම මෙම නිවේදනයෙන් විධි විධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ පැහැදිලි කිරීම් /තීරණය කිරීම් ද උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සිදු කරනු ඇත.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

පී.එස්.විමලවීර
ලේකම්
උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2026.05.29 වන දින,

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.